# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# ANNUAL REPORT 2017

## ඉඩම් මැනුම් සභාව
## நில அளவைச் சபை
## Land Survey Council

ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය,අංක150, කොළඹ 05
நில அளவைச் சபை, நில அளவையாளர் அதிபதி அலுவலகம்,இல.150 பெர்னாட்கொழும்பு 05
Land Survey Council, Surveyor General’s Office,No 150, Colombo 05

# පටුන


| | | |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ පණිවුඩය | 03 |
| 2. | දැක්ම සහ මෙහෙවර | 04 |
| 3. | ඉඩම් මැනුම් සභාව | 05 |
| 4. | ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් | 05 |
| 5. | ඉඩම් මැනුම් සභාව සතු බලතල | 06 |
| **6.** | **2017 වර්ෂය තුළ දී ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධනය** | **07** |
| 7. | ඉඩම් මැනුම් සභාවේ කාර්යාලීය කාර්යය මණ්ඩලය | 08 |
| 8. | ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම් | 09 |
| 9. | අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් | 12 |
| 10. | මූල්‍ය කළමනාකරණය | 13 |
| 11. | 2017 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශන (ඇමුණුම්) | |

I. මූල්‍ය තත්ව ප්‍රකාශනය
II. මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය
III. ශුද්ධ වත්කම් බැරකම් ප්‍රකාශනය
IV. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
V. 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ සටහන
VI. 2017 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම් ප්‍රතිපත්ති
12. විගණකාධිපති වාර්තාව 2017

# 01. සභාපතිතුමාගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව
අංක150
බර්නාඩ් සොයිසා මාවත
නාරාහේන්පිට
කොළඹ 05
2018-12-10

ගෝලීය තරඟකාරී වෙළඳපොළ තුළ වෘත්තියෙන් උසස් මැනුම් සේවාවක් සැපයීම උදෙසා වෘත්තියවේදීන් ශක්තිමත් කිරීමට 2017 වසර තුළ ඉඩම් මැනුම් සභාවට හැකියාවක් ලැබීම පිළිබඳ බෙහෙවින් සතුටු වෙමි.

2002 අංක 17 දරණ මැනුම් පනත තුළින් ඉඩම් මැනුම් සභාවට පැවරී ඇති කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රධාන වශයෙන් මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, වෘත්තියමය මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තියමය විනය පාලනය මැනුම් සභාවේ වගකීම් වේ. එපමණක් නොව ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට එරෙහිව මහජනයා ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීමත්, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ තොරතුරු මහජනයා වෙත ලබා දීමත්,වෙනත් වෘත්තියමය ආයතන සමග සමායෝජනය කිරීමත් ඉඩම් මැනුම් සභාවේ වගකීම්වලට අයත්ය.

මැනුම් පනතේ විධි විධානවලට අනුව ඉඩම් මැනුම් කටයුතු නියාමනය කිරීම පනත ක්‍රියාත්මක වී දශකයකටත් වැඩි කාලයක් ගත වූ පසුව හෝ 2016 වසරේදී ඒ සඳහා රෙගුලාසි සකස් කර අත්හදා බැලීමේ කාලයකට දිවයින පුරා මැනුම් කටයුතු නියාමනය සඳහා කටයුතු යොදන ලදී.

කෙටියෙන් සඳහන් කරන්නේ නම් සෑම මිනින්දෝරු වෘත්තිකයෙකුම තම වෘත්තිය කටයුතු ක්‍රමවත්ව සහ නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වා ගැනීමට උනන්දු කරවීම මෙම රෙගුලාසිවල අපේක්ෂාව විය. මිනින්දෝරු වෘත්තිය සම්බන්ධ සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය සහ කැපවීම මගින් එළිදුටු මෙම රෙගුලාසි අනුව කටයුතු කිරීම සෑම මිනින්දෝරු වෘත්තිකයෙකුට මෙන්ම පොදුවේ රටටම ප්‍රතිලාභ අත් වන්නක් බව මා තරයේ විශ්වාස කරමි. මෙම අත්හදා බැලීම් තුළින් ඉදිරිපත්වන කරුණු අනුව අදාළ රෙගුලාසි සංශෝධනය/වැඩි දියුණුකර ගැසට් මගින් ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ඇත.

ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය මෙන්ම වෘත්තිමය විනය පවත්වා ගැනීම උදෙසා 2016 වසරේදී ද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන පුහුණු පාඨමාලා කිහිපයක්ම අනුමත කොට පැවැත්වීමට ඉඩම් මැනුම් සභාව විශේෂයෙන් කටයුතු කර ඇත. එහි දී පාඨමාලාවලට සහභාගී වීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් විසින් දක්වන ලද උනන්දුව කැපී පෙනුනි.

සමාලෝචිත කාල සීමාව තුළ ඉඩම් මැනුම් සභාව හොඳින් පවත්වා ගෙන යාම සඳහා වැඩ බලන ලේකම්, ගණකාධිකාරී (අර්ධ කාලීන) ඇතුළු සමස්ත කාර්යය මණ්ඩල මෙන්ම ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය සහ කැපවීම පිළිබඳ මාගේ ස්තුතිය පුද කරමි.

පී.එම්.පී. උදයකාන්ත
සභාපති

# 02. දැක්ම සහ මෙහෙවර

## දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛණ්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත්වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරුකර ඒ තුළින් තරඟකාරී ගෝලීය වෙළඳපොළ තුළ ගුණාත්මක මෙන්ම වෘත්තීය නිපුණත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වී වෘත්තීයමය පරිසරය ශක්තිමත් කිරීම ඉඩම් මැනුම් සභාවේ දැක්ම වේ.

## මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත් වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන්වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තීයට ප්‍රවේශවන්නන් වෙත ලැබෙන බවටත් එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බව තහවුරු කිරීම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

## 03. ඉඩම් මැනුම් සභාව

2002 අංක 17 දරණ මැනුම් පනතේ සඳහන් විධි විධාන අනුව 2003 වර්ෂයේ මාර්තු මාසයේදී කොළඹ 05, බර්නාඩ් ද සොයිසා මාවත,අංක 150 දරණ ලිපිනයේ පිහිටා ඇති සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල තුළ ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කරන ලද අතර එදින පටන් මේ දක්වාම එම ස්ථානයේ ඉඩම් මැනුම් සභාව පවත්වා ගෙන එනු ලැබේ.

මැනුම් පනතේ 27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සංයුතිය කෙසේ විය යුතු ද යන්න පිළිබඳව විදිවිධාන දක්වා ඇත. එකී විධි විධානවලට අනුව ඉඩම් මැනුම් සභාව සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර එම සාමාජිකයින් පත් වන ආකාරය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

(අ). නිලබලයෙන් පත්වන සාමාජිකයින්

i. සභාපති - සර්වේයර් ජනරාල් වරයා

ii. උප සභපති - සර්වේයර් ජනරාල් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්ට අඩු නොවන ධූරයක් දරණ ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු

iii. සාමාජික - 1969 අංක 21 මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවා ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ආ). පත්කරන සාමාජිකයින්

i. සාමාජික `- 1982 අංක 22 දරණ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ සාමාර්ථයන් දරණ මිනින්දෝරුවරුන් තිදෙනෙක්

ii. සාමාජික - 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් පිහිටවූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරණු ලබන, විශ්ව විද්‍යාලයක අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂෙත්‍රයන් හි එක් විද්වතෙකු

iii. ඉහත (ii) සහ (iii) මෙම පත්කිරීම් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.

## 04. ඉඩම් මැනුම් සභාව වෙත පැවරී ඇති කාර්යභාරයන්

ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් මැනුම් පනතේ 37 වගන්තිය යටතේ පහත පරිදි දක්වා ඇත.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්යය පරිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තිමය විනය පවත්වාගෙන යාම.

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම්, පළපුරුද්ද, හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරීම.

(ඈ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම් පත්‍ර භාර ගැනීම සහ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවන්හි ඔවුන්ට වාර්ෂිකව එම බලපත්‍ර නිකුත් කිරීම.

(ඇ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වා ගෙන යාම ප්‍රවර්ධනය කිරීම.

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා වෘත්තීමය සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධන කිරීම.

(ඊ) ඉඩම් මැනීම පිළිබඳ ශාස්ත්‍රීය හා වෘත්තීමය සුදුසුකම් පිළිගැනීම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තීමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වූ අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ විභාග හා වෘත්තීමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

(උ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදී සම තත්වයක් සහ අනන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යොන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

(එ) ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තීමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් මිනුම් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම.

## 05. ඉඩම් මැනුම් සභාව සතු බලතල

ඉඩම් මැනුම් සභාව වෙත පැවරෙන බලතල මැනුම් පනතේ 38 වැනි වගන්තිය යටතේ පහත පරිදි දක්වා ඇත.

( අ ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

( ආ ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීමට සහ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඒවා යොදා ගැනීම.

( ඇ ) සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

( ඈ ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම.

( ඉ ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

( ඊ ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

( උ ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සහ

( ඌ ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු දේ කිරීම.

## 06. 2017 වර්ෂය තුළදී ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධනය

### 1. 2017 ජනවාරි මස පළමුවන දා (1) සිට දෙසැම්බර් මස 31දක්වා කාලය තුළ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන්

සමාලෝචිත වර්ෂය තුළ, එනම්, 2017 ජනවාරි මස 1සිට දෙසැම්බර් මස 31දක්වා කාලය තුළ ඉඩම් මැනුම් සභාවේ පහත නම් සඳහන් අය සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

| අනු අංකය | නම | තනතුර | කාලසීමාව |
|---|---|---|---|
| 1 | **පී.එම්.පී උදයකාන්ත මහතා** | සභාපති | 2017.01.01 සිට 2017.12.31 දක්වා |
| 2 | එස්.එම්.පි.පී. සංගක්කාර මහතා | උප සභාපති | 2017.01.01 සිට 2017.12.31 දක්වා |
| 3 | එස්.කේ.විජේසිංහ මහතා | සාමාජික | 2017.01.01 සිට 2017.02.06 දක්වා |
| 4 | ඩබ්ලිව්. එම් . එස් .වීරසිංහ මහතා | සාමාජික | 2017.02.07 සිට 2017.12.31 දක්වා |
| 5 | සී.ද.එස්. ගුණතිලක මහතා | සාමාජික | 2017.01.01 සිට 2017.12.31 දක්වා |
| 6 | එම්. කළුතන්ත්‍රි මහතා | සාමාජික | 2017.01.01 සිට 2017.12.31 දක්වා |
| 7 | ඩබ්ලිව්.ඒ.ඒ. විජේරත්න මහතා | සාමාජික | 2017.01.01 සිට 2017.12.31 දක්වා |
| 8 | **ආචාර්ය කේ.ආර්.එම්.යූ. බණ්ඩාර මහතා** | සාමාජික | **2017.01.01 සිට 2017.12.31 දක්වා** |

### 2. 2017 ජනවාරි මස 1සිට දෙසැම්බර් මස 31දක්වා කාලසීමාව තුළ සභාවේ සාමාජිකයන්ගේ සේවා කාල

ඉහත සඳහන් සමාලෝචිත කාලය තුළදී සභාවේ සාමාජිකයින් සේවය කරන ලද කල සීමාවන් පහත දැක්වේ.

| අනු අංකය | නම | තනතුර | කාල සීමාව |
|---|---|---|---|
| 1 | පී.එම්.පී උදයකාන්ත මහතා | සභාපති | 2014.05.29 සිට (අවු. 03 මාස 07 දින 02) |
| 2 | එස්.එම්.පි.පී. සංගක්කාර මහතා | උපසභාපති | 2014.05.29 සිට (අවු. 03 මාස 07 දින 02) |
| 3 | එස්.කේ.විජේසිංහ මහතා | සාමාජික | 2016.01.25 සිට (අවු.01 මාස 00 දින 11) |
| 4 | ඩබ්ලිව්.එම්.එස්.වීරසිංහ මහතා | සාමාජික | 2016.02.07 සිට (අවු. 00 මාස 10 දින 24) |
| 5 | සී.ද.එස්. ගුණතිලක මහතා | සාමාජික | 2015.01.01 සිට (අවු. 03 මාස 00 දින 00 |
| 6 | එම්. කළුතන්ත්‍රි මහතා | සාමාජික | 2015.01.01 සිට (අවු. 03 මාස 00 දින 00) |
| 7 | ඩබ්ලිව්.ඒ.ඒ.විජේරත්න මහතා | සාමාජික | 2015.01.01 සිට (අවු. 03 මාස 00 දින 00) |
| 8 | ආචාර්ය කේ.ආර්.එම්.යු බණ්ඩාර මහතා | සාමාජික | 2015.01.01 සිට (අවු. 03 මාස 00දින 00 |

## 3. සභාවේ රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ සහභාගිවීම්

සමාලෝචිත වර්ෂය තුළදී එක් එක් සාමාජිකයින් තම ධූර කාලය තුළ සභා රැස්වීම්වලට පහත සඳහන් පරිදි සහභාගී වී ඇත.

| අනු අංකය | නම | තනතුර | රැස්වීම් ගණන |
|---|---|---|---|
| 1 | පී.එම්.පී උදයකාන්ත මහතා | සභාපති | 22 |
| 2 | එස්.එම්.පි.පී. සංගක්කාර මහතා | උප සභාපති | 22 |
| 3 | එස්.කේ.විජේසිංහ මහතා | සමාජික | 02 |
| 4 | ඩබ්ලිව්.එම්.එස්.වීරසිංහ මහතා | සාමාජික | 18 |
| 5 | ආචාර්ය කේ.ආර්.එම්.යු බණ්ඩාර මහතා | සාමාජික | 17 |
| 6 | .සී. ද.එස්. ගුණතිලක මහතා | සාමාජික | 13 |
| 7 | එම්. කළුතන්ත්‍රි මහතා | සාමාජික | 23 |
| 8 | ඩබ්ලිව්.ජේ.ජේ. විජේරත්න මහතා | සාමාජික | 21 |

## 07. ඉඩම් මැනුම් සභාවේ කාර්යාලීය කාර්යය මණ්ඩලය

මැනුම් පනතේ 55 වැනි වගන්තිය මගින් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයයි සභාව සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත් කර ගැනීමට මැනුම් සභාවට බලය පැවරී ඇත. ඒ අනුව සමාලෝචිත කාල සීමාව තුළ මැනුම් සභාවේ කාර්යාලීය කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | නම | තනතුර | කාල සීමාව |
|---|---|---|---|
| 1 | ජී..ඩී.එස්.කේ. ගුණරත්න මහතා | වැඩ බලන ලේකම් | 2009.01.01 සිට 2017.11.17 දක්වා |
| 2 | වයි.එම්.එස්.මල්ලිකාරත්න මහතා | අර්ධකාලීන පදනම මත | 2016.06.01 සිට 2017.08.24 දක්වා |
| 3 | එස්.ඩී.පී.ජී.එන්.පී.ජයරත්න මිය | අර්ධ කාලීන පදනම මත | 2017.08.25 සිට 2017.12.31 දක්වා |
| 4 | ඩබ්ලිව්.ජේ.එස්.ප්‍රියදර්ශනි මෙනවිය | පරිගණක වැඩසටහන්සහකාර / ලිපිකරු 1 | 2004.05.24 සිට 2017.12.31 දක්වා |
| 5 | ආර්.එම්.එන්.රත්නායක මිය | පරිගණක වැඩසටහන්සහකාර/ ලිපිකරු 2 | 2013.03.18 සිට 2017.12.31 දක්වා |
| 6 | ටී.ජී.ප්‍රනාන්දු මහතා | කාර්යාල කාර්ය සහායක | 2004.07.15 සිට 2017.12.31 දක්වා |

# 08. ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්

1. **ලියාපදිංචි කිරීම**


සමාලෝචිත වර්ෂය සඳහා, එනම්, 2017 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ලද අයදුම්පත්‍රවලට අනුව, ඒ එක් එක් මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම්, පළපුරුද්ද, හැකියාව සහ නිපුණතාවය ඇති බවට පරීක්ෂා කර බලන ලදී.

ඒ අතුරින් සභාව සෑහීමකට පත්වීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළදී ඉඩම් මැනුම් සභාව බලයලත් මිනින්දෝරුවන් 10 ක් අලුතින් ලියා පදිංචි කළේය.ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියා පදිංචිය ලබා ගත් මුළු මිනින්දෝරුවරු සංඛ්‍යාව 2101කි.

2. **වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර**

සමාලෝචිත වර්ෂය සඳහා මැනුම් වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාර ගැනීම 2016 සැප්තැම්බර් මාසයේදී අරඹන ලදී. අනතුරුව, ඒ සඳහා එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව පරීක්ෂා කර බැලීමෙන් පසුව 2017 වර්ෂය තුළදී ඉඩම් මැනුම් සභාව විසින් අලුතින් වාර්ෂික බලපත් 1004 ක් නිකුත් කරන ලදී. මෙය, 2016 වසර තුළ නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍ර සංඛ්‍යාව වන 1031 සමග සැසඳීමේදී 2.6%ක අඩුවීමක් බව නිරීක්ෂණය වේ.

2016 සහ 2017 වසර තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් මිනින්දෝරුවරුන් වෙත නිකුත් කරන ලද වාර්ෂික මැනුම් බලපත්‍ර පිළිබඳ සංඛ්‍යාමය තොරතුරු පහත දැක්වෙන රූපයේ ප්‍රස්තාරිකව නිරූපණය කර ඇත.




2017 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ සමාලෝචිත වර්ෂය සඳහා පෙබරවාරි 28 දිනට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මූලික තොරතුරු, එනම්, මුලකුරු සමඟ නම, ලියාපදිංචි අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය යන තොරතුරු 2017මාර්තු මස 23 වන දිනැති අංක 2011/24 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර පළ කිරීමට සභාව කටයුතු කරන ලදී.

එයට අමතරව, වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ අදාළ සියලු තොරතුරු, එනම්, ලියාපදිංචි අංකය, මුලකුරු සමඟ නම, සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ලිපිනය, දුරකථන අංක, වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර අංකය හා බලපත්‍රය වලංගු කාලසීමාව ආදී තොරතුරු ඉඩම් මැනුම් සභාවේ නිල

වෙබ් අඩවියට (www.landsurveycouncil.org) ඇතුළත් කර ඇත. මෙම විස්තර ත්‍රෛමාසිකව යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ඇත.

## 3. මහජනතාව වෙත තොරතුරු ලබා දීම.

ඉඩම් මැනුම් සභාව විසින් ලබාදෙන සේවාවන් පිළිබඳව මහජනතාව මේ වන විට මනාව දැනුවත් වී ඇත. එබැවින්, වසර සිය ගණනක් පැරණි පිඹුරු සම්බන්ධයෙන් වුවද, ඊට අදාළ මැනුම් කටයුතු කර ඇති බලයලත් මිනින්දෝරුවරුන්ගේ ජීව දත්ත තොරතුරු ලබා ගැනීම සඳහා ඉඩම් මැනුම් සභාව වෙත පැමිණෙන පිරිස් පසු ගිය කාලය තුළ සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ඊට අමතරව, විද්‍යුත් තැපැල මගින්ද එම තොරුතුරු සඳහා නිරතුරුවම ඉල්ලීම් ලැබේ. එම තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා දීමට මැනුම් සභා කාර්ය මණ්ඩලය ඉමහත් කැපවීමකින් කටයුතු කරන අතර, එහිදී එම තොරතුරු එසැනින් ලබා දීමට හැකි සෑම විට ම කටයුතු කරනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළ මහජනතාවගේ ඉල්ලීම් අනුව අවස්ථා 180 කදී තොරතුරු ලබා දී ඇත.

වාර්ෂික බලපත්‍රලාභී සියලුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ පෞද්ගලික ලිපිනය, ලියාපදිංචි අංකය, දුරකථන අංකය, වාර්ෂික බලපත්‍ර අංක ආදී තොරතුරු ඇතුළත් පරිගණක ගත දත්ත පද්ධතියක් මැනුම් සභාව විසින් සකස් කර පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. ඊට අමතරව, ඔවුන්ගේ ඡායා රූපයක් ද එම දත්ත පද්ධතියට ඇතුලත් කිරීමට ඉදිරියේදී කටයුතු කෙරෙනු ඇත. මෙම දත්ත පද්ධතියට ඔවුන්ගේ දුරකථන අංක ඇතුළු සම්බන්ධතා තොරතුරු ඇතුළත් කර ඇති නිසා අවශ්‍ය පිඹුරුවල පිටපත් ලබා ගැනීමට ඔවුන් කෙලින්ම සම්බන්ධ කර ගැනීමේ පහසුකම මෙමගින් මහජනතාවට ලැබී ඇත. එතකුදු වුව ද, මේ දක්වා මැනුම් සභාව විසින් ලබා දෙන මෙම සේවාව හරහා මහජනතාවට අවශ්‍ය බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙළ කළ පැරණි පිඹුරුවල පිටපත් ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට නොහැකි වී ඇත. මැනුම් කටයුතු සම්බන්ධයෙන් මහජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස මෙය හඳුනා ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් සභාවේ දැඩි අවධානය යොමු කර ඇත.

## 4. ඉඩම් මැනුම් සභාව වෙත ලද මහජන පැමිණිලි


බලයලත් මිනින්දෝරුවරුන් විසින් කරනු ලබන වෘත්තීමය විෂමාචාරවලට සම්බන්ධව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීම ඉඩම් මැනුම් සභාව සතු තවත් එක් ප්‍රධාන කර්තව්‍යකි. හුදෙක්, මෙම පැමිණිලි විභාග කරනුයේ මැනුම් පනතේ 46 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධානවලට යටත්ව වේ. පැමිණිලි විභාග කිරීම සඳහා සෑම මසකට වරක් ඉඩම් මැනුම් සභාව රැස්වෙන අතර එක සභා වාරයකදී පැමිණිලි 6 ක් හෝ 7 ක් විභාග කිරීමට කටයුතු කරයි. මෙමගින්, මහජනතාවට ඉඩම් ගැටළු සම්බන්ධයෙන් පවතින ගැටළු බොහෝ දුරට නිරාකරණය කර ගැනීමට හැකි වන අතර මිනින්දෝරුවරුන් අතර විනය පවත්වා ගෙන යාමට ක්‍රියා මාර්ගයක්ද සැලසෙනු ඇත.

කෙසේ වුවද, සමහර පැමිණිලිවල ස්වභාවය අනුව, එනම්, අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්, චෝදනා ඔප්පු කිරීමට තරම් වූ සාක්ෂි නොමැති, අධිකරණ නියෝග අනුව උසාවි කොමසාරිස්වරුන් ලෙස කරන ලද මැනුම් සහ ඉඩම් මැනුම් සභාවේ බලතල යටතේ ක්‍රියාකල නොහැකි ගණයේ පැමිණිලි සම්බන්ධව ඉඩම් මැනුම් සභාව තීරණ ලබා නොදෙන අතර, එවැනි අවස්ථාවලදී අදාළ පැමිණිලිකරුවන්ට එම ගැටළු අධිකරණ ක්‍රියා මාර්ගයෙන් විසඳා ගැනීමට අවශ්‍ය උපදෙස් දෙනු ලැබේ.

2016 වසරේ ලැබී විභාග කර අවසන් නොවූ පැමිණිළි හා 2017 වසරේ තුළ විභාග කළ පැමිණිළි පිළිබඳ සංඛ්‍යා තොරතුරු මෙහි පහතින් දැක්වේ.

| | |
|---|---|
| 2017 ජනවාරි මස 1 දිනට විභාග අවසන් නොවී ඉතිරිව තිබූ සංඛ්‍යාව | = 45 |
| 2017 වසර තුළදී ලද මුළු පැමිණිළි සංඛ්‍යාව | = 80 |
| 2017 වසර තුළදී විභාග අවසන් කරණ ලද පැමිණිළි සංඛ්‍යාව | = 96 |
| 2017 දෙසැම්බර් 31 දිනට විභාග අවසන් නොවී ඉතිරි වූ සංඛ්‍යාව | = 29 |

2016 වසර තුළදී ලද පැමිණිලි සංඛ්‍යාව 96 වූ අතර එයට සාපේක්ෂව 2017 වසර තුල පැමිණිලි සංඛ්‍යාව 16% කින් අඩුවී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලි විභාග අවසන් කිරීම 2016 වසරේදී 91 ක් වූ අතර එයට සාපේක්ෂව 2017 වසරේ පැමිණිලි විභාග කර අවසන් කිරීම 5.5% කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය වේ.
මෙම දත්ත පහත දැක්වෙන රූපයේ ප්‍රස්ථාරිකව නිරූපණය කර ඇත.




**5. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියා මාර්ග**

මැනුම් කටයුතු කිරීමේදී විෂමාචාර ක්‍රියාවන් කර ඇති බවට සභාව නිගමනය කර ඇති විටෙක එවැනි අයට එරෙහිව 2002 අංක 17 දරණ මැනුම් පනතේ 47 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව දඬුවම් පමුණුවා ලිය හැක.

2017 වසරේදි ඉඩම් මැනුම් සභාව විසින් ඉහත 4 වැනි ඡේදයෙහි විස්තර කර ඇති පරිදි, ලැබෙන පැමිණිලි විභාග පවත්වනු ලැබීමෙන් පසුව ගන්නා ලද තීරණ අනුව වග උත්තරකාර මිනින්දෝරුවරුන්ට පහත සඳහන් පරිදි දඬුවම් පමුණුවන ලදී.

| | |
|---|---|
| ලියා පදිංචිය අවලංගු කල සංඛ්‍යාව | = 00 |
| ලියා පදිංචිය තාවකාලිකව අත් හිට වූ සංඛ්‍යාව | = 01 |
| වාර්ෂික බලපත්‍රය අවලංගු කල සංඛ්‍යාව | = 00 |
| වාර්ෂික බලපත්‍රය තාවකාලිකව අත් හිට වූ සංඛ්‍යාව | = 01 |

2017 වසර තුළ දී එලෙස දඬුවම් පමුණුවන ලද මිනින්දෝරුවරුන් පිළිබඳ විස්තර පහත වගු අංක 1 හි දක්වා ඇත.

| පැමිණිලි අංක | ලියාපදිංචි අංක | මිනින්දෝරුවරයාගේ නම | ගන්නා ලද ක්‍රියා මාර්ගය |
|---|---|---|---|
| LSC/5/879 | 19921508 | ඒ. එම්. නජුවුඩීන් | 2017-08-01 සිට2018-07-31 දක්වා බලපත්‍රය අත්හිටුවන ලදී. |
| LSC/5/890 | 19890159 | එච්. විජයතුංග | 2017-11-01සිට2018-12-31 දක්වා ලියාපදිංචිය අත්හිටුවන ලදී. |

# 09. අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

## 1. අඛණ්ඩ වෘත්තීය සංවර්ධන ( CDP) පාඨමාලා

බිම් මැනීම හා සම්බන්ධ විෂයයන් ගත් කළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අත්‍යවශ්‍ය අංගයක් වේ. මැනුම් වෘත්තියේයෙදී සිටින සහ මැනුම් සභාවේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන වෘත්තිකයන්ගේ දැනුම සහ දක්ෂතා වැඩි දියුණු කර ලීම සඳහා වෘත්තීය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ඉඩම් මැනුම් සභාව සතු කාර්යක් බවට මැනුම් පනතේ 37 වැනි වගන්තිය යටතේ විධි විධාන සලස්වා ඇත. එබැවින් සියලුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මැනුම් වෘත්තිය හා සම්බන්ධව නූතන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳව වූ පුහුණු පාඨමාලා / වැඩමුළුවලට සහභාගි කර වීම සඳහා උනන්දු කරවීම ඉඩම් මැනුම් සභාව විසින් සිදු කරනු ලබයි.

මෙහිදී, පුද්ගලික මැනුම් වෘත්තියෙහි නියලීමට අපේක්ෂාකරන ආධුනික ලියාපදිංචි මැනුම් වෘත්තිකයන් දිශානුගත කිරීමේ වැඩ සටහන් මෙන්ම පළපුරුදු මිනින්දෝරුවරුන් සඳහා දියුණු තාක්ෂණික ක්‍රමවලට අදාළ වැඩ සටහන් ද වෙන් වශයෙන් පවත්වනු ලැබේ. තවද, ඉඩම් මැනුම් සභාවට අමතරව, එහි නියාමනය යටතේ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දොරුවරුන්ගේ සංගම් වැනි පිළිගත් ආයතන මගින්ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ.

## 2. ප්‍රථම වරට වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ලබාගන්නා මිනින්දෝරුවරුන් සඳහා වැඩමුළු

ඉඩම් මැනුම් සභාව විසින් වෘත්තියේ යෙදීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍රය යොදා ගනිමින් වෘත්තීය මිනින්දෝරුවරුන් ලෙස තම වෘත්තියට ප්‍රථම වරට පිවිසෙන අවස්ථාවේදී ඔවුන් සඳහා දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීම ඉඩම් මැනුම් සභාව විසින් වාර්ෂිකව සිදු කරයි. එම පාඨමාලාවල දී සම්පත් දායකත්වය සඳහා තාක්ෂණික දැනුමක් හා පළපුරුද්දක් සහිත කීර්තිමත් ලියාපදිංචි මිනින්දෝරුවරුන් යොදා ගනිමින් නවක මිනින්දෝරුවන් හට අවශ්‍ය දැනුම සහ අවබෝධය ලබා දීම සිදු කෙරෙනු ඇත.

## 3. බාහිර ආයතනවිසින් පවත්වනු ලැබූ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පැවැත්වීමෙහි ලා විශේෂ උනන්දුවකින් කටයුතු කරයි. එම පාඨමාලා ඉඩම් මැනුම් සභාව විසින් පිළිගැනීමට ලක්කර ඇති අතරජ් සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ බාහිර ආයතන දක්වනු ලබන උනන්දුව පිළිබඳ ඉඩම් මැනුම් සභාව අතිශයින් සතුටට පත් වේ.

2017 වසරේදි පවත්වා ඇති අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.


| | ආයතනය | වෘත්තීය සංවර්ධන පාඨමාලාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1. | මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Bimsaviya Surveys | 23-03-17 |
| 2. | ඉඩම් මැනුම් සභාව | Workshop - 12 | 24-03-17 |
| 3. | ශ්‍රී ලංකා මිනින්දෝරු සංගමය | Information and Communication Technology (ICT) LIDAR- An Introduction and Overview | 28-04-17 |
| 4. | ශ්‍රී ලංකා මිනින්දෝරු සංගමය | Distance Learning Programme Surveying - Related Modules | 25-05-17 |
| 5. | ඉඩම් මැනුම් සභාව | Technical Session I | 30-06-17 |

| | | | |
|---|---|---|---|
| 6. | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Construction Surveys | 06-07-17 |
| 7. | ශ්‍රී ලංකා මිනින්දෝරු සංගමය | Land Law | 15-07-17 |
| 8. | මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Sri Lanka Continuously Operating Reference Station | 21-08-17 |
| 9. | ඉඩම් මැනුම් සභාව | Technical Session II | 15-10-17 |
| 10. | මාතර හම්බන්තොට දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Application and usage of ZW Cad and application of new Technology | 01-11-17 |

# 10. මූල්‍ය කළමනාකරණය

## 1. ආදායම් සහ වියදම

පහත දැක්වෙන 3 වැනි රූපයේ 2016 සහ 2017 වසරවල මුළු ආදායම සහ වියදම ප්‍රස්ථාරිකව නිරූපණය කර ඇත.




3 වැනි රූපය

2017 වසර තුළදී ඉඩම් මැනුම් සභාව රැස් කරන ලද මුළු ආදායම රු.3,910,376.30 ක් වූ අතර එම වසර තුළදී දරන ලද මුළු වියදම 4,923,415.28 විය. ඒ අනුව 2016 වසර සමඟ සැසඳීමේදී, 2017 වසර තුලදී සභාව රැස් කරන ලද ආදායම සහ වියදම පිළිවෙළින් රු.92,460.46කින් සහ රු.271,069.44 කින් වැඩි වී ඇත.

## 2. සභාවේ අරමුදල් සහ මූල්‍ය කළමනාකරණය

මැනුම් පනතේ 56 (2) වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ අරමුදල් රැස් කළ යුතු ආකාරය විස්තර කර ඇත. ඒ අනුව, ඒකාබද්ධ අරමුදලින් ලැබිය හැකි මුදල් ද, මැනුම් පනත යටතේ සභාවට දී ඇති බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන මුදල් ද, සභාවට බැර කළ යුතු වේ. එයට අමතරව ත්‍යාග ප්‍රදාන සහ පරිත්‍යාග වශයෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවේ අරමුදලට එකතු වේ. සභාවේ කාර්යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීමේදී වැය වන මුදල් මැනුම් පනතේ 56 වගන්තිය යටතේ සලසා ඇති විධිවිධාන අනුව මෙම අරමුදලින් ගෙවිය යුතු වේ.

ඉඩම් මැනුම් සභාවට මහා භාණ්ඩාගාරයෙන් ආරම්භ වසර දෙකකදී පමණක් මූල්‍ය ප්‍රතිපාදන ලැබී ඇත. එබැවින් මැනුම් සභාවේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළ සියලු ආයතනික සහ පරිපාලන වියදම් දරන ලද්දේ එමගින් රැස් කර ගන්නා අරමුදල් මගිනි. මැනුම් සභාවේ සියලු මුදල් මැනුම් සභාව විසින් කළමණාකරණය කරනු ලැබේ.

මැනුම් සභාවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය වන්නේ මිනින්දෝරු වෘත්තිකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම වේ. එයට අමතරව පුහුණු වැඩ සටහන් වැඩමුළු පැවැත්වීමෙන්, මහජනතාවට තොරතුරු නිකුත් කිරීමෙන්, මහජන පැමිණිලි ඇතුලත් කිරීමෙන් සහ පරීක්ෂණ ගාස්තු ලෙස වූදිත මිනින්දෝරුවරුන්ගෙන් අය කරන පරීක්ෂණ ගාස්තු ආදියෙන් ද මැනුම් සභාවට අරමුදල් එක් රැස් වේ.

2017.12.31 දිනට ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ගිණුම් කිහිපයක තිබූ මුදල රු.7,212,222.08 කි.

## 3. මූල්‍ය කටයුතු විගණනය

මැනුම් සභාව විසින් කරනු ලබන මූල්‍ය කටයුතු විගණකාධිපති විසින් වාර්ෂික විගණනය සඳහා භාජනය කරනු ලැබේ. විගණන කළමණාකරණ කමිටුවක් ද මැනුම් සභාව විසින් පත් කර ඇති අතර එය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

i. මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු (සභාපති)
ii. මැනුම් සභාවේ ලේකම් (ලේකම්)
iii. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු (නිරීක්ෂක)
iv. මැනුම් සභාවේ සභිකයන් දෙදෙනෙකු (සාමාජික)
v. මැනුම් සභාවේ ගණකාධිකාරී (සාමාජික)

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එස් සිවානන්දරාජා
සභාපති
ඉඩම් මැනුම් සභාව

Chairman
Land Survey Council

## 11. 2017 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශන (ඇමුණුම්)

## ඉඩම් මැනුම් සභාව
## 2017 දෙසැම්බර් 31 වන දිනට
## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| විස්තරය | සටහන් | 2017 | | 2016 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1 | 954,351.59 | | 1,075,549.95 | |
| ස්ථාවර තැන්පතු | 2 | 5,000,000.00 | | 5,000,000.00 | |
| | | | **5,954,351.59** | | **6,075,549.95** |
| | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| ආපදා ණය | 3 | 320,665.00 | | 218,415.00 | |
| ලැබිය යුතු දෑ | 4 | 956,447.92 | | 508,000.00 | |
| ස්ථාවර තැන්පතු | | - | | 1,000,000.00 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 5 | 2,212,222.08 | | 2,174,549.69 | |
| | | | **3,489,335.00** | | **3,900,964.69** |
| | | | | | |
| **මුළු වත්කම්** | | | **9,443,686.59** | | **9,976,514.64** |
| | | | | | |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධන සැපයුම** | | | | | |
| මහා භාණ්ඩාගාරය | | 1,043,030.00 | | 1,043,030.00 | |
| සමුච්චිත අරමුදල | | 5,678,559.95 | | 6,504,170.24 | |
| අතිරික්තය/හිඟය | | (1,013,038.98) | | (834,430.00) | |
| | | | **5,708,550.97** | | **6,712,770.24** |
| | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු වියදම් | 6 | 370,598.12 | | 291,891.57 | |
| උපචිත වියදම් | | | | 234,595.62 | |
| අවිනිශ්චිත ගිණුම | 7 | | | 8,819.71 | |
| හඳුනා නොගත් කලින් ලැබීම් | | 3,364,537.50 | | 2,728,437.50 | |
| | | | 3,735,135.62 | | 3,263,744.40 |
| **මුලු හිමිකම් හා වගකීම්** | | | **9,443,686.59** | | **9,976,514.64** |

ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයන් වගකියනු ලැබේ
මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත .

එච්.එම්.බී.පී.හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එස් සිවානන්දරාජා
සභාපති)
ඉඩම් මැනුම් සභාව
Chairman
Land Survey Council

කේ.එල්.ඒ.එන්.සඳමාලි
සභාපති
ඉඩම් මැනුම් සභාව
Accountant
Land Survey Council



එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

## ඉඩම් මැනුම් සභාව

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධනය

| විස්තරය | | සටහන | 2017 | | 2016 | |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| ආදායම් | | | | | | |
| | බලපත්‍ර ගාස්තුව | | 2,510,000.00 | | 2,577,500.00 | |
| | ලියාපදිංචි ගාස්තුව | | 31,500.00 | | 84,000.00 | |
| | පොලී ආදායම් | 8 | 676,304.76 | | 539,515.81 | |
| | වෙනත් ආදායම් | 9 | 165,311.54 | | 231,613.87 | |
| | වැඩමුළු ශුද්ධ ආදායම | 10 | 527,260.00 | | 385,286.16 | |
| | මුළු ආදායම | | | 3,910,376.30 | | 3,817,915.84 |
| වියදම් | | | | | | |
| | <u>ආයතන හා පරිපාලන වියදම්</u> | | | | | |
| | වැටුප් හා වේතන | 11 | 1,006,388.93 | | 820,095.41 | |
| | අතිකාල හා නිවාඩු දින දීමනා | | 24,292.28 | | | |
| | වෙනත් දීමනා | 12 | 2,663,377.67 | | 2,656,616.29 | |
| | දේශීය ගමන් වියදම් | | 13,356.00 | | 17,378.00 | |
| | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 148,399.79 | | 46,317.29 | |
| | ආහාර පාන වියදම් | | 181,448.25 | | 133,726.00 | |
| | යන්ත්‍ර උපකරණ නඩත්තු වියදම් | | 19,722.50 | | 10,545.00 | |
| | යන්ත්‍ර උපකරණ ගොඩනැගීමේ වියදම් | | 95,360.88 | | 15,000.00 | |
| | තැපැල් හා සන්නිවේදන | | 164,105.97 | | 238,172.16 | |
| | විදුලිය හා ජලය | | 78,734.40 | | 78,734.40 | |
| | විගණන ගාස්තු | | 173,800.00 | | | |
| | වෙනත් | | 156,633.25 | | 486,428.47 | |
| | | | | 4,725,619.92 | | 4,503,013.02 |
| | <u>මූල්‍ය හා වෙනත් වියදම්</u> | | | | | |
| | ක්ෂයවීම | | 197,795.36 | | 149,332.82 | |
| | මුළු වියදම් | | | 4,923,415.28 | | 4,652,345.84 |
| කාල සීමාවට අදාළ අතිරික්තය/ඌණතාව | | | | (1,013,038.98) | | (834,430.00) |

**ඉඩම් අමාත්‍යාංශය**

**ඉඩම් මැනුම් සභාව**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය**

| විස්තරය | ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අරමුදල/ඌණතාවය | එකතුව |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 5,669,740.24 | 6,712,770.24 |
| පෙර වර්ෂයේ ගැළපීම් | | 8,819.71 | 8,819.71 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | | (1,013,038.98) | (1,013,038.98) |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 4,665,520.97 | 5,708,550.97 |

**ඉඩම් අමාත්‍යාංශය**

**ඉඩම් මැනුම් සභාව**

**2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විස්තරය | සටහන | 2017 | | 2016 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල්ප්‍රවාහ** | | | | | |
| අතිරික්තය/(ඌණතාවය) | | (1,013,038.98) | | (834,430.00) | |
| | | | | | |
| **මුදල් නොවන සංචලනයන්** | | | | | |
| ක්ෂයවීම | | 197,795.36 | | 149,332.82 | |
| ස්ථාවර තැන්පතු පොලිය | | (676,304.76) | | (539,515.81) | |
| **මූලධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | | **(478,509.40)** | | **(390,182.99)** |
| | | | | | |
| **මූලධන වෙනස්වීම්** | | | | | |
| ආපදා ණය (වැඩිවීම)/අඩුවීම | | (102,250.00) | | 91,140.00 | |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (46,500.00) | | (18,793.00) | |
| ස්ථාවර තැන්පතු (වැඩිවීම)/අඩුවීම | | 1,000,000.00 | | (1,000,000.00) | |
| ගෙවිය යුතු වියදමෙහි වැඩිවීම/(අඩුවීම) | | (234,595.62) | | 105,658.99 | |
| උපචිත වියදමෙහි වැඩිවීම/(අඩුවීම) | | 78,706.55 | | 74,731.73 | |
| හඳුනානොගත් ලැබීම්හි වැඩිවීම/(අඩුවීම) | | 636,100.00 | | 132,037.50 | |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | **1,424,460.93** | | **(797,504.78)** |
| | | | | | |
| ආයෝජන කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහ | | | | | |
| ස්ථාවර තැන්පතු (වැඩිවීම)/අඩුවීම | | 181,356.84 | | 2,383,703.47) | |
| ස්ථාවර තැන්පතු පොලිය | | | | 104,515.81 | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම | | (76,597.00) | | (558,395.00) | |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | **104,759.84** | | **1,929,824.28** |
| | | | | | |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | | | | |
| පෙර වර්ෂයේ ගැළපීම් සමුච්චිත අරමුදල සඳහා | | | | | |
| | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑවල දළ වැඩිවීම/(අඩුවීම) | | | 37,672.39 | | (92,293.49) |
| කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ | | | 2,174,549.69 | | 2,266,843.18 |
| කාලසීමාව අවසානයේ මුදල් හා මුදල් සමානදේ | | | 2,212,222.08 | | 2,174,549.69 |

## ඉඩම් මැනුම් සභාව
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට අදාළ සටහන්

1 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ

| අයිතම | 2017-01-01 දිනට ශේෂය රු. | වර්ෂය තුළදී මිළදී ගැනීම රු. | එකතුව රු. | ක්ෂය වීම % | වාර්ෂික ක්ෂයවීම රු. | 2017.12.31 දිනට ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|
| **ස්පෘෂ්ට වත්කම්:** | | | | | | |
| යන්ත්‍රෝපකරණ | 187,178.90 | | 187,178.90 | 20 | 37,435.78 | *149,743.12* |
| ගෘහ භාණ්ඩ | 149,653.01 | | 149,653.01 | 10 | 14,965.30 | *134,687.71* |
| පරිගණක | 195,774.81 | 125,370.00 | 321,144.81 | 25 | 48,943.70 | *272,201.11* |
| කාර්යාලිය උපකරණ | 21,111.89 | | 21,111.89 | 25 | 5,277.97 | *15,833.92* |
| ඉ.මැ.ස.නාම පුවරුව | 31,584.96 | | 31,584.96 | 20 | 6,316.99 | *25,267.97* |
| ගොඩනැගිලි හා පිරියත | 455,855.80 | (48,773.00) | 407,082.80 | 20 | 81,416.56 | 325,666.24 |
| **අස්පෘශ්‍ය වත්කම්:** | | | | | | |
| ගිණුම් මෘදුකාංගය | 34,390.58 | | 34,390.58 | 10 | 3,439.06 | 30,951.52 |
| **එකතුව** | 1,075,549.95 | 76,597.00 | 1,152,146.95 | | 197,795.36 | 954,351.59 |

2 ස්ථාවර තැන්පතු

| අනු අංකය | බැංකුව | කාලය | ගිණුම් අංකය | වටිනාකම | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|
| 1 | HDFC බැංකුව | වර්ෂ 02 | 74891 | 5,000,000.00 | |
| | | | | | 5,000,000.00 |

3 ආපදා ණය

| නම | ණය මුදල | මුළු මුදල |
|---|---|---|
| ටී.ජී.ප්‍රනාන්දු | 224,485.00 | |
| ආර්.එම්.එන්.රත්නායක | 96,180.00 | |
| | | 320,665.00 |

4 ලැබිය යුතු දෑ

| අයිතමය | මුදල | මුලු මුදල |
|---|---|---|
| ස්ථාවර තැන්පතු පොළි අංකය 81786998 | 6,562.50 | |
| අංකය 81787043 | 6,718.75 | |
| අංකය 74891 | 916,666.67 | |
| වැඩමුළු ආදායම | 1,500.00 | |
| පැමිණිලි ගාස්තු | 25,000.00 | |
| | | 956,447.92 |

5 මුදල් හා සමාන දෑ

| | | | | | |
|---|---|---|---|---|---|
| බැංකුවේ ඇති මුදල | | | | | 953,060.17 |
| අතැති මුදල් | | | | | 0 |
| ස්ථාවර තැන්පතු | | | | | |
| අනු අංකය | බැංකුව | කාලය | ගිණුම් අංකය | වටිනාකම | |
| 1 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 3 | 80945401 | 105139.35 | |
| 2 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | දින 7 තැන්පතු | 80945454 | 154,022.56 | |
| 3 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 3 | 81786998 | 500,000.00 | |
| 4 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 6 | 81787043 | 500,000.00 | 1,259,161.91 |
| | | | | | 2,212,222.08 |

6 උපචිත වියදම්

| අනු අංකය. | වියදම් | රු. | රු. |
|---|---|---|---|
| 1 | විගණන ගාස්තු | 352,229.00 | |
| 2 | පාලක මණ්ඩල දීමනා | 8,928.00 | |
| 3 | අතිකාල දීමනා | 6,219.28 | |
| 4 | තැපැල් හා විදුලි වියදම් | 3,221.84 | |
| | | | 370,598.12 |

7 ගෙවිය යුතු වියදම්

| | |
|---|---|
| 2014 අවසන් ප්‍රකාශය අනුව | 278,176.00 |
| නිවැරදි ශේෂය | 254,723.00 |
| වෙනස | 23,453.00 |

| | |
|---|---|
| 2017 අතිරික්තය සඳහා ගැළපීම | 14633.00 |
| අවිනිශ්චිත ගිණුම් | 8,820.00 |
| එකතුව | 23,453.00 |

ජ'නල සටහන

| | | |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුම | හර | 8,819.71 |
| සමුච්චිත අරමුදල | බැර | 8,819.71 |

8 ස්ථාවර තැන්පත් පොළී

| අනු අංකය. | තැන්පතු අංකය | රු. | රු |
|---|---|---|---|
| 1 | 74890 | 34,166.67 | |
| 2 | 80118497 | 45,578.53 | |
| 3 | 80118896 | 15,594.95 | |
| 4 | 80945472 | 8,521.45 | |
| 5 | 80945401 | 5,139.35 | |
| 6 | 80945402 | 4,022.56 | |
| 7 | ලැබිය යුතු පොළී | 563,281.25 | 676,304.76 |

9 වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| පැමිණිලි ලියාපදිංචි ගාස්තු | 35,000.00 | |
| මහජන තොරතුරු නිකුත් කිරීම සඳහා අයකිරීම් | 36,400.00 | |
| සේවක ණය පොළී | 12,208.84 | |
| පැමිණිලි ගාස්තු | 15,000.00 | |
| පඩි රහිත නිවාඩු | 12,040.20 | |
| වැඩමුළු ආදායම වෙනත් | 54,662.50 | |
| | | 165,311.54 |

10 වැඩමුළු ශුද්ධ ආදායම

| අයිතමය | මුදල | ශුද්ධ මුදල |
|---|---|---|
| ආදායම | 1,912,500.00 | |
| වියදම් | 1,385,240.00 | |
| | | 527,260.00 |

11 වැටුප් හා වේතන

| වියදම | මුදල | මුලු මුදල |
|---|---|---|
| වැටුප් හා වේතන | 798,898.68 | |
| සේවක අර්ථසාධක අරමුදලේ දායකත්ව මුදල | 165,992.21 | |
| සේවක භාරකාරත්ව අරමුදලේ දායකත්ව මුදල | 41,498.04 | |
| | | 1,006,388.93 |

12 වෙනත් දීමනා

| දීමනා | වියදම | මුලු වියදම |
|---|---|---|
| සභාපතිගේ කාර්ය දීමනා | 450,000.00 | |
| උප සභාපතිගේ කාර්ය දීමනා | 360,000.00 | |
| වැඩබලන ලේකම්වරයාගේ කාර්ය දීමනා | 115,590.00 | |
| | | |
| ගණකාධිකාරිගේ කාර්ය දීමනා | 109,503.00 | |
| විගණන කමිටු සාමාජිකයන්ගේ දීමනා | 124,000.00 | |
| ඉ.මැ.ස. සාමාජික දීමනා | 808,792.00 | |
| ජීවන වියදම් දීමනා | 280,800.00 | |
| අන්තර් /ගැළපුම් දීමනා | 265,203.42 | |
| විශේෂ දීමනා | 41,239.25 | |
| පුහුණු සේවක දීමනා | 108,250.00 | |
| | | **2,663,377.67** |

සැපයුම

13. වෙනත්

| අයිතමය | වියදම | මුලු වියදම |
|---|---|---|
| ලැමිනේටින් | 17,775.00 | |
| මුද්‍රණ සහ පොත් බැඳීම් | 27,250.62 | |
| පරිවර්තන ගාස්තු | 714.00 | |
| | | |
| ප්‍රචාරණ | 103,712.75 | |
| විවිධ වියදම් | 7,180.88 | |
| | | 156,633.25 |

# ඉඩම් මැනුම් සභාව
## 2017-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
## පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. පොදු ගිණුම් ප්‍රතිපත්ති

1.1. සැකසීමේ පදනම
ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට සහ 1971 අංක.38 දරන මූල්‍ය පනතේ විධිවිධානවලට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබේ.

1.2. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සකස් කොට ඇත.

1.3. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ සකස් කෙරේ.

2. වත්කම් ඇගයීමේ පදනම

2.1. ස්ථාවර වත්කම් කපාහල අගයට දක්වා ඇත.

2.2. ක්ෂය වීම
ස්ථාවර වත්කම් ක්ෂයවීම හීනවන ශේෂ ක්‍රමය යටතේ පසුගිය වර්ෂයට අනුකූලව පහත සඳහන් අනුපාතය මත සපයා ඇත.

| වත්කම් වර්ගය | % |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 20 |
| ගෘහ භාණ්ඩ | 10 |
| පරිගණක | 25 |
| කාර්යාලීය උපකරණ | 25 |
| නාම පුවරුව | 20 |
| ගොඩනැගිලි හා පිරියත | 20 |
| ගිණුම් මෘදුකාංගය | 10 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ජීපීඑල්/බී/එල්එස්සී/01/17/03 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2018 ජූනි 20 දින

සභාපති

ඉඩම් මැනුම් සභාව

**ඉඩම් මැනුම් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ඉඩම් මැනුම් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 57(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2018 අප්‍රේල් 27 දින නිකුත් කරන ලදී.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 25 ඡේදයට පටහැනිව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී රු.1,000,000 ක ආයෝජන කල් පිරීම, කාරක ප්‍රාග්ධන වෙනස්වීමේ ගැලපීමක් ලෙස දක්වා තිබුණු අතර, ප්‍රවර්තන වර්ෂයේ පරිගණක මිලදී ගැනීම් වෙනුවෙන් වැය කරන ලද රු.125,370 කින් පෙර වර්ෂයේ වැඩිපුර ගෙවීම් වෙනුවෙන් වූ රු.48,773 ක ආපසු ලැබීම් හිලව් කර ශුද්ධ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සේවක පාරිතෝෂික සම්බන්ධයෙන් සභාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර, සේවක පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුලදී සිදුකරන ලද විවිධ විෂමාචාර වෙනුවෙන් මිනින්දෝරුවරුන්ගෙන් අයකිරීමට මැනුම් සභාව විසින් තීරණය කරන ලද රු.62,500 ක දඩ මුදල් රු.15,000 ක් ලෙස ගිණුම් ගතකර තිබීම නිසා ආදායම හා ජංගම වත්කම් රු.47,500 කින් අඩුවෙන් සටහන්කර තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනත. | |
| (අ) 12(1) වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් සකස්කර සහතික කරන ලද නිශ්චිත වර්ගවල මුල් පිඹුරු හෝ සිතියම් පිටපත් දත්ත පාදකයක් (Data Base) පිහිටුවීම සඳහා තැන්පත් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 43(1) හා (2) වගන්තිය | සභාව විසින් සියළුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පලකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව 1004 ක් වුවද, 2017 මාර්තු 23 දිනැති අංක 2011/24 දරන ගැසට් පත්‍රයේ මිනින්දෝරුවරුන් 841 දෙනෙකුගේ ගේ නම් පමණක් පල කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,013,039 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.834,430 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.178,609 ක පිරිහීමක් දක්නට ලැබුණි. වැටුප් හා වේතන රු.186,294 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උච්චාවචනයන් සහිතව මූල්‍ය අතිරික්තයක් පෙන්නුම් කෙරුණි. එසේ වුවද 2015 හා 2016 වර්ෂවලදී එය ඌනතාවයක් බවට පත්වී තිබූ අතර 2017 වර්ෂයේදී එම ඌනතාවය රු.1,013,039 ක් දක්වා වර්ධනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ දී රු.3,325,057 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2017 වර්ෂයේ දී රු.2,878,815 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2017 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් 0.93 ක් හා 1.19 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ජංගම අනුපාතය පහල මට්ටමක පැවතුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී කෙටි කාලීන ස්ථාවර තැන්පතු මුදල් කරගෙන වර්ෂයේ වියදම් දැරීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ජංගම වත්කම් තුළ 2017 වර්ෂයේ දී සියයට 63 ක් හා 2016 වර්ෂයේ දී සියයට 81 ක් නියෝජනය වනුයේ මුදල් හා මුදල්වලට සමාන දෑ වන අතර ඒ අනුව ආයතනය විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම්වල රඳවා තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

2002 අංක 17 දරන මැනුම් පනත ප්‍රකාරව, මැනුම් වෘත්තීය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තුවන්නා වූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟවන ලෙස පුහුණුවක් හෝ අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශවන්නන් වෙත ලැබෙන බවටත්, එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බවටත් තහවුරු කිරීම සභාවේ අරමුණු වේ.

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරුවරුන්ගේ වෘත්තිය විෂමාචාර පිළිබඳව මහජනතාවගෙන් ලැබී විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 125 ක් වුවද වර්ෂය තුල විසඳා තිබුණේ පැමිණිලි 96 ක් හෙවත් සියයට 77 ක ප්‍රමාණයක් පමණි.

(ආ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී වෘත්තිය සංවර්ධන වැඩසටහන් 06 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණ ද පවත්වා තිබුණේ වැඩසටහන් 03 ක් පමණි.

(ඇ) ස්වකීය නිළධාරීන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීමට සහ සුභසාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීමට සැලසුම් කර තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණු අතර, සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් අවශ්‍ය රීති සකස්කර ද නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ කටයුතු ආරම්භ කළ 2005 වර්ෂයෙන් පසුව මිනින්දෝරුවරයකු සභාවේ ලියාපදිංචි වීමේදී අයකරනු ලබන රු.3,500 ක් වූ ලියාපදිංචි ගාස්තුව හා 2010 වර්ෂයෙන් පසුව වාර්ෂික බලපත්‍ර වෙනුවෙන් මිනින්දෝරුවරයකුගෙන් අයකරනු ලබන රු.2,500 ක් වූ ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සංශෝධනය කර නොතිබුණි.

(ආ) වාර්ෂික බලපත්‍ර නිකුත් කරනු ලැබීමට හිමිකම් ඇති සෑම මිනින්දෝරුවරයකුම ඉඩම් මැනුම් පනත යටතේ ලියාපදිංචි විය යුතු බව දක්වා ඇතත්, වාර්ෂිකව බලපත්‍ර ලබා නොගෙන වෘත්තීය මිනින්දෝරු කටයුතුවල යෙදෙන පුද්ගලයින් හඳුනාගැනීමට හෝ එවන් කටයුතු තහනම් කිරීමට සභාව විසින් නීති රීති හඳුන්වා දී නොතිබුණි.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

වටිනාකම රු.500,000 ක් වූ ස්ථාවර තැන්පතු දෙකක් කල් පිරෙන දිනයට පෙර මුදල් කර ගැනීම නිසා සභාවට රු.14,375 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 38(ඇ) ඡේදය පරිදි සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා ප්‍රමාණවත් නිළධාරීන් හා සේවකයින් පත්කළ යුතු බව සඳහන් කර තිබුණ ද, 2018 මාර්තු 31 දින වන විටත් සභාවට බඳවාගෙන තිබුණේ ලිපිකරුවන් දෙදෙනෙකු සහ කාර්යාල කාර්ය සහායකවරයකු පමණි. ඒ අනුව නිළධාරීන්ගේ හිඟය, පැමිණිලි විසඳීමේ හා ලිපිගොනු යාවත්කාලීන කිරීමේ කටයුතුවලට බාධාවක් වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැයගත ආදායම් වියදම් තථ්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් ශීර්ෂ 03 ක හා වැය විෂයයන් 07 ක සියයට 24 සිට සියයට 386 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) නිළධාරීන් පුහුණු කිරීම සඳහා අයවැය ලේඛනය මඟින් රු.100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, පුහුණු වැඩමුළු පවත්වා නොතිබුණි.

(ඇ) මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙහි රු.380,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද ඉන් රු.254,630 ක් හෙවත්, සියයට 67 ක් වර්ෂ අවසානයට ඉතිරිකර තිබුණි.

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

2009 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර එම තනතුරට නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන ලෙසට 2012 ජූලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණි. එම බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.99,288 ක් වැයකර තිබුණද විගණන දිනය වූ 2018 මාර්තු 31 දක්වාම එම තනතුර පිරවීමට නොහැකිව තිබුණි.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව 2015 සහ 2016 වර්ෂ වලට අදාල සභාවේ වාර්ෂික වාර්තා 2018 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.4 සමාජ වගකීම් ඉටුකිරීම**

බලයලත් මිනින්දෝරුවරුන් විසින් මැනුම්කර සකස් කරන පිඹුරු, මහජනතාවට ලබාගැනීමට හැකිවන පරිදි ඒවායේ පිටපත් මිනින්දෝරුවන් වෙතින් ලබාගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම නිසා ගිණුම්කරණ අඩුපාඩු පැවතීම. |
| (ආ) ආදායම් පාලනය | ගාස්තු සංශෝධනය කර නොතිබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති